Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

විෂය : නාට්‍ය හා රංගකලාව

සතිය : 11

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය

සකස් කිරීම : මාවනැල්ල කලාපය

# කතන්දර කියමු





ජනකතා යනු අතීතයේ මිනිසා විසින් තම අත්දැකීම් ඇසුරින් රසවත්ව නිර්මාණය කරගත් කතන්දර වේ.මෙසේ අප විසින් කියවන ලද ජනකතා වචන භාවිතයෙන් අනෙක් අයට ඉදිරිපත් කළ හැක.

## එසේ කතන්දර කීමේදී අප සැලකිලිමත් විය යුතු කරුණු.......................



- අසන්නාට පැහැදිලිව තේරුම් ගැනීමට හැකිවීම.
- රසවත්ව සිද්ධි ඉදිරිපත් කිරීම.
- ජනකතාව නිවැරදිව ගලපා තිබීම.
- අර්ථය ඉස්මතුවන ලෙස කතාව කීම.
- උචිත බස්වහරක් හා ගැලපෙන උච්චාරණ විලාස භාවිතය.
- සබකෝලයෙන් තොරව ඉදිරිපත් කිරීම.
- කතන්දරය කීමේදී අන් අයගේ අවධානය ලබා ගැනීම.

*පහත දැක්වෙන්නේ එක්තරා කතන්දරයකි. ඒ ආකාරයට අපට කියවන ලද ජනකතා පිරිසක් ඉදිරියේ වාචිකව ඉදිරිපත් කළ හැක. අපි පාඩුවෙන් කාන්සියෙන් කම්මැලිකමෙන් සිටින අවස්ථාවල මෙසේ කියවන ලද ජනකතා අනෙක් අය සමග බෙදාහදා ගතහැක.*

## නුවණක්කාර කුරුල්ලා





ඔන්න දරුවනේ එකමත් ඒක රටක නපුරු සිංහයෙක් කැලෑවක වාසය කළා. මේ සිංහයා හරිම නපුරුයි. මේ සිංහයා නිතරම වගේ අහිංසක කුරුල්ලන්ට කරදර කරනවා. කුරුලු බිත්තර කඩා දමනවා. කුරුල්ලන්ට හරිම දුකයි. මේ කරදරකාර සිංහයත් එක්ක හරිම තරහින් හිටියේ. " අපට හරිම කරදරේ." කුරුල්ලෝ නිතරම කතාවුණා. මේ අතර ඒ කැලේ හිටියා නුවණක්කාර කුරුලු ජෝඩුවක්. "අපි මේකට හොඳ උපායක් කල්පනා කරන්න ඕනෑ." කුරුලු ජෝඩුව කිව්වා. කුරුලු ජෝඩුව උදේම නැගිටලා. රබර් බිත්තර තියෙන කූඩුවක් හැදුවා. ඒ කූඩුව සිංහයාට පේන්න තිබ්බා. සිංහයා බිත්තර කූඩුව අරන් සෙල්ලම් කරන්න ගත්තා. කුරුල්ලෝ කීච් කීච් ගගා හිනා වුණා. සිංහයාට එතකොට තේරුණා




පැවරුම ඃ

- ඔබ දන්නා කතන්දරයක් චිත්‍ර සටහන් සහිතව ලියා දක්වන්න.
- එසේ එකතුකරගත් කතන්දර යොදාගෙන පොත් පිංචක් හදන්න.